රා.සේ.කො.ස. චක්‍රලේඛ :- 02/2016

මගේ අංකය :- PSC/APP/HB/02-2016

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
අංක 177,
නාවල පාර,
නාරාහේන්පිට,
කොළඹ 05.

2016 මැයි මස 02 දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

**පත් කිරීම් සහ උසස් කිරීම් සම්බන්ධයෙන් සිදුවන ප්‍රමාදයන් වළක්වා ගැනීම**

අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මගින් පත් කිරීම් සහ උසස් කිරීම් සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීමේදී අදාළ සියලුම ලිපිලේඛන සම්පූර්ණ කර එකවර ඉදිරිපත් නොකිරීම හේතුවෙන් නැවත නැවත විමසීම් කිරීමට සිදුවේ.මෙම හේතුව නිසා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අවසන් තීරණය ලබා දීමේදී ඇතිවන ප්‍රමාදයන් වලක්වා ගැනීම සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු බව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කර ඇත.

02. පත්කිරීම් හා උසස් කිරීම් වලට අදාළව සම්මුඛ පරීක්ෂණ සම්බන්ධයෙන් අදාළ පරිපාලන බලධරයාගේ නිර්දේශ රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන මුල් අවස්ථාවේදීම එම සම්මුඛ පරීක්ෂණ උපලේඛන වල මුල් පිටපත්, අදාළ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ ඇතුලත් වාර්තාව, එක් එක් අයදුම්කරුවන් සඳහා සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දීම සඳහා අදාළ කර ගත් සියලු ලිපිලේඛන වල සහතික කරන ලද ඡායා පිටපත් ඇතුලත් සහතික පත්‍ර ගොනු ද ඉදිරිපත් කළ යුතුය.

03. පත්කිරීම් හා උසස් කිරීම් සම්බන්ධයෙන් වන සෙසු කරුණු වලට අදාළව නිර්දේශ රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමේදී www.psc.gov.lk වෙබ් අඩවියේ ආකෘති පත්‍ර හා පිරික්සුම් ලයිස්තු යටතේ සඳහන් සියලු අවශ්‍යතා සම්පූර්ණ කර ඇති බවට අදාළ පරිපාලන බලධරයා විසින් සහතික විය යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

එච්.එම්. ගාමිණී සෙනෙවිරත්න
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.